# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2335/17 - 2023 ජුනි මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2023.06.08**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය, ජීවන් තොන්ඩමන් වන මම, එකී මණ්ඩලයට දෙහිවල ගල්කිස්ස අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ PS 06 අපජල පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**ජීවන් තොන්ඩමන්,**
ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/02/CO/536

2023 ජුනි මස 06 වැනි දින,
ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 538 B කළුබෝවිල ග්‍රාම නිලධාරි වසමේ කළුබෝවිල ගමේ පිහිටි දළ සැලැස්මේ පෙන්නුම් කරන ඉඩම් කොටසේ පර්චස් 03 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස,

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස;
*නැගෙනහිරට* : ප්‍රවේශ මාර්ගය;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස හා ප්‍රවේශ මාර්ගය;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස;

ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය : 01. කළමණාකාර අධ්‍යක්ෂතුමා,
ඔරෙක්ස් ප්‍රොපටිස් පුද්ගලික සමාගම,
අංක 3/2 නාවලපිටිය පාර,
ගම්පොළ.

EOG 06-0033